# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම

1

♦ බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම, එය තහවුරු කොට ගැනීම සහ මේ රට පාලනය කිරීමට විවිධ අවස්ථාවල දී ඔවුන් විසින් හඳුන්වා දෙන ලද ආඥාක්‍රම සහ පරිපාලන රටාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

## බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

★ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම සිදු වූයේ අවස්ථා කිහිපයක දී ය.

- ක්‍රි.ව. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම.
- ක්‍රි.ව. 1802 දී මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් කිරීම.
- ක්‍රි.ව. 1815 දී උඩරට රාජ්‍යය අත් පත් කොට ගැනීම.

★ බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට හේතු වූ ප්‍රධාන කරුණු දෙකකි.

1. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
2. ශ්‍රී ලංකාවේ තිබූ වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම

## ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම

ඉන්දියාවේ අධිරාජ්‍යය පිහිටුවීමේ නිරත වී සිටි ඉංග්‍රීසීන්ට ඔවුන්ගේ නැව් නැංගුරම් ලා තැබීම සඳහා වරායයන් අවශ්‍ය විය. මේ සඳහා යෝග්‍ය වරායයන් කිහිපයක් ම ලංකාවේ පිහිටා ඇත. ඉන්දියාවට අයත් දීර්ඝ මුහුදු තීරයක් පැවතුණ ද,පිහිටීම අනුව ඉන්දියාවේ වරායන්ට වඩා ශ්‍රී ලංකාවේ වරායයන් වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය ස්වාභාවික පිහිටීම අතින් සුවිශේෂ වේ. ත්‍රිකුණාමල වරායේ රට තුළට කාවැදුණු බොක්ක නිසා නැව් තද සුළඟින් විශේෂයෙන් මෝසම් සුළං වලින් ආරක්ෂා කොට ගත හැකි විය. එසේ ම එකවර නැව් කිහිපයක් ම නැංගුරම් ලා තැබීමට ද මෙහි ඉඩකඩ ප්‍රමාණවත් විය. මෙහි සිට ඉන්දියාවේ වෙරළ ආරක්ෂා කිරීමත් සාගරයේ ගමන් ගන්නා සතුරු නැව්වලට පහර දීමත් කළ හැකි ය.ඉන්දියාවේ

තම ආධිපත්‍යය පිහිටුවා ගැනීමේ බ්‍රිතාන්‍යයන් සමඟ තරගයක නිරත වී සිටි ප්‍රංශයෝ ද ත්‍රිකුණාමල වරාය අත් පත් කොට ගැනීමට වෙහෙසුනහ. මෙම කරුණ ශ්‍රී ලංකාව අල්ලා ගැනීමටත් එහි බලය තහවුරු කොට ගැනීමටත් බ්‍රිතාන්‍යයන් මෙහෙය වූ හේතුවක් විය.



රූපය 1.1 ත්‍රිකුණාමල වරාය

## වෙළෙඳ කටයුතු

"යුරෝපීය වෙළෙඳුන්ගේ දෘෂ්ටියෙන් බලන කල මෙරට වැදගත්කම පැවතුණේ එය නැගෙනහිර ලෝකයේ කුරුඳු නිෂ්පාදනය කළ ප්‍රධාන රට වීමේ හේතුව නිසා ම යැයි කිව හැකි තරම් ය."

යුරෝපීය ජාතියක් වූ බ්‍රිතාන්‍යයන්ට ද ලංකාව වැදගත් වීමේ හේතුවක් ඉහත ප්‍රකාශයෙන් ඔබට තේරුම් ගත හැකි වනු ඇත.

මෙහි දී කුරුඳු මෙරටින් ලබාගත හැකි වූ වෙළෙඳ භාණ්ඩ අතුරින් එක් ප්‍රධාන භාණ්ඩයක් පමණි. ඊට අමතර ව යුරෝපීය වෙළෙඳුන් මෙරටින් ගෙන ගිය සෙසු කුළු බඩු අතර ගම්මිරිස්, එනසාල්, කරාබු නැටි ආදිය ද වෙනත් භාණ්ඩ අතර මුතු, මැණික්, ඇත්දත් යනාදිය ද ප්‍රධාන විය.

ඉහළ මිලකට අලෙවි කළ හැකි වූ මේ භාණ්ඩ ලබා ගැනීම සහතික කර ගත හැකි වූයේ ඒවා උපදින රට, එනම් ශ්‍රී ලංකාව අල්ලා ගැනීමත් එහි බලය තහවුරු කොට ගැනීමත් මගින් බව බ්‍රිතාන්‍යයෝ වටහා ගත්හ.

## ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම

ප්‍රංශ මහා විප්ලවය ක්‍රි.ව. 1789 දී ආරම්භ වූ බව අපි දනිමු. එහිදී රාජාණ්ඩුවලට විරුද්ධව නැඟී සිටි ප්‍රංශය අසල්වැසි ඕලන්දය ආක්‍රමණය කෙළේ ය. ඒ අවස්ථාවේ ඕලන්දයේ සිටි රජු හෙවත් ස්ටැඩ්හෝල්ඩර්වරයා එනම් ඔරේන්ජ්හි පස්වන විලියම් කුමාරයා එංගලන්තයට පළා ගියේ ය.

ශ්‍රී ලංකාව අත් පත් කොට ගැනීමේ අභිලාෂයෙන් සිටි, මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් බ්‍රිතාන්‍යයෝ තම රටට පැමිණි ඕලන්ද පාලකයාගෙන් ලබා ගත් ලිපියක් ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරයා වෙත ඉදිරිපත් කළහ. එහි තිබුණේ "**ලංකාවේ ලන්දේසි ප්‍රදේශ ප්‍රංශයන්ගේ අතට පත්වීම වැළැක්වීම සඳහා ඉංග්‍රීසීන්ට භාර දිය යුතු ය.**" යනුවෙනි. ඕලන්ද ස්ටැඩ්හෝල්ඩර්වරයා එංගලන්තයේ කිව් (kew) මාලිගාවේ රැකවරණය ලබමින් ලියූ බැවින් මෙය "කිව් ලිපිය" යනුවෙන් ද හැඳින්වේ . එවක මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි ආණ්ඩුකාරයා වූ එංගල්බෙක් එක්වරම එම අණට අවනත වූයේ නැත .

බ්‍රිතාන්‍යයන් ද කල් බලමින් සිටියේ නැත. ඔවුහු ශ්‍රී ලංකාවේ ලන්දේසි ප්‍රදේශවලට පහර දීම ආරම්භ කළහ. ඉංග්‍රීසීන්ට වඩාත් වැදගත් වූ ත්‍රිකුණාමල වරාය 1795 දී අල්ලා ගත් අතර ක්‍රමයෙන් යාපනය, මන්නාරම, කල්පිටිය, කොළඹ සහ ගාල්ල ආදී ප්‍රදේශ අත්පත් කොට ගත්හ. මේ ආකාරයෙන් ක්‍රි.ව. 1796 පෙබරවාරි වන විට ලන්දේසීන් සතුව පැවති මුහුදුබඩ ප්‍රදේශ සියල්ල ම ඉංග්‍රීසීන් අතට පත් ව තිබිණි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

"ඉංග්‍රීසීන්ට ශ්‍රී ලංකාව වැදගත් වූයේ එහි පිහිටීම නිසා ය / වෙළෙඳ වටිනාකම නිසා ය" යන මැයෙන් පංතියේ විවාදයක් පවත්වන්න.

### ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම

මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කොට ගැනීමේ වියදම දරනු ලැබුවේ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසිනි. ඒ නිසා එම ප්‍රදේශවල පාලනය ද සමාගමට පැවරිණි.

"බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර" යටතේ මෙම පරිච්ඡේදයේ ඉදිරි පිටුවල සාකච්ඡා කරනු ලබන පරිදි ක්‍රි.ව. 1797-98 මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පාලනයට විරුද්ධ ව කැරැල්ලක් ඇති විය. එයින් පසුව සිදු කළ පරිපාලන වෙනස්කම් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍යයන් සතුව පැවති ප්‍රදේශ කිරීටයේ යටත් විජිතයක් බවට පත් කිරීමේ පළමු අදියර විය.

ඒ අනුව ක්‍රි.ව. 1798 සිට මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම සමඟ හවුලේ පාලනය කිරීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් පියවර ගෙන තිබිණි. රජය සහ වෙළෙඳ සමාගම හවුලේ පාලනය කළ එම ක්‍රමය ''ද්විත්ව පාලන ක්‍රමය''නමින් හැඳින්විණි. එම විධි විධානය ද එතරම් සාර්ථක නොවූ නිසා ක්‍රි.ව. 1802 දී මුහුදුබඩ ප්‍රදේශවල පාලන කටයුතුවලින් සමාගම ඉවත් කොට එම ප්‍රදේශ එංගලන්තයේ රජු සහ පාර්ලිමේන්තුව යටතේ පාලනය කරනු ලබන කිරීටයේ යටත් විජිතයක් බවට පත් කෙරිණි.

## ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කොට ගැනීම

බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අල්ලා ගැනීම සඳහා ප්‍රයත්න දෙකක් දරන ලදී.

1. ක්‍රි.ව. 1803 ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයාගේ ආක්‍රමණය.
2. ක්‍රි.ව. 1815 රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයාගේ ආක්‍රමණය.

බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජ්‍යය අල්ලා ගැනීමට අවශ්‍ය වූ හේතු කිහිපයකි.

- රට තුළ ස්වාධීන රාජ්‍යයක් තිබීම මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍යයන්ගේ කටයුතුවලට කිහිප ආකාරයකින්ම බාධාවක් වීම,
- මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසින්ට විරුද්ධව සිදු කෙරෙන කැරළි කෝලාහලවලට උඩරට රජු උදව් දීම,
- උඩරට සමඟ වෙළෙඳ කටයුතුවලදී උඩරට රාජ්‍යය සහ මුහුදුබඩ ප්‍රදේශ අතර තිබූ කඩවත්වලදී උඩරට රජුට බදු ගෙවීමට සිදුවීම නිසා වෙළෙඳ කටයුතුවලට අවහිර ඇතිවීම,
- බ්‍රිතාන්‍යයන්ගේ පාලන මධ්‍යස්ථානය වූ කොළඹ සහ නාවික මධ්‍යස්ථානය වූ ත්‍රිකුණාමලය අතර ගොඩබිම ඔස්සේ සම්බන්ධතා පැවැත්වීමට උඩරට රජුගෙන් අවසර නොලැබීම හා උඩරට රාජ්‍යය බාධාවක් වීම,
- මුහුදුබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා වෙරළ දිගේ මෙන්ම උඩරට සහ මුහුදුබඩ ප්‍රදේශ අතර දේශ සීමාව යන ප්‍රදේශ සීමා දෙකක් ආරක්ෂා කිරීමට සිදුවීම නිසා විශාල වියදමක් දැරිය යුතුව තිබීම දැක්විය හැකි ය.

## බ්‍රිතාන්‍යයන්ගේ පළමුවන උඩරට ආක්‍රමණය

මෙකල උඩරට රාජ්‍යය පාලනය කෙළේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය. ක්‍රි. ව. (1798 - 1815) ඔහු නායක්කර් වංශයට අයත් විය. ක්‍රි.ව. 1739 වර්ෂයේ පටන් මෙරට පාලනය කරන ලද්දේ නායක්කර් වංශයේ රජවරුන් විසින් ය. එම රජවරුන්ට විරුද්ධව උඩරට බලවේගයක් ගොඩ නැගෙමින් පැවතිණි. එය මෙරට සිංහල රදළ පන්තිය යි. පරම්පරා ගණනක් තිස්සේ රජයේ නිලතල දරමින් ද, රජ වාසල සහ පළාත් පාලන කටයුතු ද කරමින් සිටි උඩරට රදළවරු විශාල බලයක් භුක්ති විඳිමින් සිටියහ. නිලතල උරුමයෙන් ලැබූ ඔව්හු රාජ්‍ය සේවය වෙනුවෙන් රජයෙන් දෙන ලද නින්දගම්වලින් විශාල ආදායම් උපයා ගත්හ.

## පිළිමතලව්වේ මහාදිකාරම්වරයාගේ ක්‍රියාකලාපය

නායක්කර් රජුට විරුද්ධ කණ්ඩායමේ මූලිකත්වය ගෙන ක්‍රියා කෙළේ පිළිමතලව්වේ මහාදිකාරම්වරයා ය. නායක්කර් රජු නෙරපීමේ ආශාවක් පමණක් නොව තමාට රජකම අත්පත් කොට ගැනිමේ ආශාවක් ද පිළිමතලව්වේ මහාදිකාරම් තුළ පැවතිණි.

නායක්කර් වංශිකයන් යටතේ ක්‍රියාත්මක වූ සම්ප්‍රදායට අනුව රජකම උරුම විය යුතු ව තිබුණේ රජුගේ බිසවගේ සහෝදරයා වූ මුත්තුසාමිට ය. එසේ වුව ද තමාට අවශ්‍ය ලෙස හැසිරවිය හැකි යයි විශ්වාස කළ කන්නසාමි නම් කුමාරයා සිහසුනට පත් කොට ගැනීමට ඔහු සමත් විය. ඒ අනුව කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ විය. නියම උරුමකරුවා ලෙස සැලකුණු මුත්තුසාමි කුමාරයා ඉංග්‍රීසීන් වෙත පලා ගියේ ය. පිළිමතලව්වේගේ බලාපොරොත්තු ඉටු නොවන බවත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පිළිමතලව්වේගේ රූකඩයක් බවට පත් කොට ගත නොහැකි බවත් වැඩි කලක් යාමට පෙර පැහැදිලි විය.

රජතුමා පිළිමතලව්වේගේ අදහස්වලට අනුකූලව ක්‍රියා නොකරන කල්හි රජු බලයෙන් පහ කිරීමට පිළිමතලව්වේ ඉංග්‍රීසීන්ගේ සහාය පැතී ය. උඩරට කටයුතු වලට සම්බන්ධ වීමට අවස්ථාවක් උදා කොට ගැනීමට මාන බලමින් සිටි ඉංග්‍රීසීහු උඩරට රජු සමඟ ගිවිසුමක් ඇති කොට ගැනීමට කිහිප වරක්ම උත්සාහ කළහ. එහෙත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එබඳු අවස්ථාවකට ඉඩ නොදී සිටිය දී පිළිමතලව්වේ ගේ ක්‍රියාමාර්ගය නිසා ඉංග්‍රීසින් බලාපොරොත්තුවෙන් සිටි අවස්ථාව මේ ආකාරයට ස්වදේශිය නායකයෝම උදා කොට දුන්හ.

එහෙත් රාජ්‍යයකට විරුද්ධ ව යුද වැදීමට සාධාරණ හේතුවක් තිබිය යුතු ය. පිළිමතලව්වේගේ ආරාධනය ඒ සඳහා ප්‍රමාණවත් නොවී ය. තම අවශ්‍යතාව ඉටු කොට ගැනීමට සාධාරණ හේතුවක් සකසා ගැනීමට ඉංග්‍රීසින්ට එතරම් දීර්ඝ කාලයක් ගත වූයේ නැත. උඩරට ආක්‍රමණය කිරීමට අවස්ථාවක් උදාකොට දීමට පොරොන්දු වූ පිළිමතලව්වේ යෙදූ උපක්‍රමය අනුව මුහුදුබඩ ප්‍රදේශයෙන් උඩරටට ගිය වෙළෙඳුන්

කිහිප දෙනෙකුගේ භාණ්ඩ පැහැර ගෙන හිරිහැර පමුණුවා ආපසු එවන ලදී. මෙය තමන්ට කරන ලද අපහාසයක් ලෙස හුවා දක් වූ ඉංග්‍රීසි ආණ්ඩුව උඩරටට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කෙළේ ය.



රූපය 1.2
ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා විසින් උඩරට රාජ්‍යයට එරෙහි ව ක්‍රි.ව. 1803 දියත් කළ උඩරට ආක්‍රමණය නොයෙක් දුෂ්කරතා මැද සිදු වූවකි. කොළඹ සිට උඩරටට ළඟා වීමට එකල පැවතුණේ එක් කෙනෙකු පසුපස තවත් කෙනෙකුට ගමන් කළ හැකි අඩිපාරක් හෝ තවලම් පාරක් හෝ පමණි. එනම් විශේෂයෙන් ම උඩරටට ළඟාවීමට සුදුසු මාර්ගයක් නොතිබීම ය.

මහත් දුෂ්කරතා මධ්‍යයේ වුව ද මහනුවරට ඇතුළු වූ ඉංග්‍රීසි සේනාව මුත්තුසාමි රජකරවා ඔහු සමඟ තම සිතැඟි පරිදි ගිවිසුමක් ඇති කොට ගැනීමට සමත් වූහ. එහෙත් අගනුවරින් පලා ගොස් සැඟ වී සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තම සේනාව යොදවා ප්‍රතිප්‍රහාර එල්ල කොට ඉංග්‍රීසි හමුදාව සමූල ඝාතනය කිරීමට ද මුත්තුසාමි මරණයට පත් කර වීමට ද සමත් විය. උඩරට ආක්‍රමණය මෙහෙයවූ මැක්ඩෝවල් සෙන්පතියා ඇතුළු කිහිපදෙනෙක් පමණක් ජීවිත බේරා ගත් හ. මේ ආකාරයට ඉංග්‍රීසීන්ගේ පළමු වන උඩරට ආක්‍රමණය ද පෘතුගීසීන් විසින් එම රාජ්‍යයට එල්ල කරන ලද සියලු ආක්‍රමණ මෙන් පරාජයෙන් අවසන් විය.

නෝර්ත් ආණ්ඩුකාරයා විසින් උඩරට අල්ලා ගැනීමට දරන ලද ප්‍රයත්නය පරාජයට පත් වූ නමුත් උඩරට අල්ලා ගැනීමේ අභිලාෂය එයින් අවසන් වූයේ නැත. නෝර්ත්ගේ ආක්‍රමණය අසාර්ථක වීමට හේතු වූ ක්‍රියාමාර්ග නැවත නොගැනීමට ඉංග්‍රීසිහු වගබලා ගත්හ. නෝර්ත් ආණ්ඩුකාරවරයාගෙන් පසු මුහුදුබඩ ප්‍රදේශවල ආණ්ඩුකාර ධූරයට පත් වූ තෝමස් මෙට්ලන්ඩ් ක්‍රි.ව. (1805-1812) උඩරට සමඟ අවුලක් ඇති කර නොගෙන ක්‍රියා කිරීමට සමත් විය. උඩරට රාජ්‍යය යුද්ධයකින් ජය ගත නොහැකි බව අවබෝධ කොට ගත් මේට්ලන්ඩ් එංගලන්ත ආණ්ඩුවෙන් ලැබුණ උපදෙස් පරිදි උඩරට රජු සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමට උත්සාහ කෙළේ ය. ඒ අතර උඩරට රාජ්‍යය තුළ පැවති තත්ත්වයත් රදළ ප්‍රධානීන් සහ රජු අතර පැවති සම්බන්ධතාවල ස්වභාවයත් උපක්‍රමශීලීව සොයා බැලීමේ කාර්යය එවක සිවිල් සේවයේ නිරත ව සිටි ජෝන් ඩොයිලිට පැවරී ය.

## රොබට් බ්‍රවුන්රිග් (ක්‍රි:ව:1812-1820)

උඩරට අත්පත් කොට ගැනීම සඳහා වූ ඊළඟ ආක්‍රමණය මෙහෙය වූයේ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසිනි. ඔහු ආයුධ බලයට වඩා උපාය මගින් උඩරට රාජ්‍යය ජය ගැනීම සඳහා කටයුතු කළ බව පෙනේ. ඒ නිසා උඩරට ආක්‍රමණය කිරීමට සුදුසු වාතාවරණයක් සකස් කිරීමේ දී බ්‍රවුන්රිග්ට බෙහෙවින් උපකාර කෙළේ සිංහල භාෂාව හා සංස්කෘතිය හොඳින් හදාළ ජෝන් ඩොයිලි ය. ඔහු උඩරට රාජ්‍යයේ නායකයන් සහ භික්ෂූන් වහන්සේලා ඇසුරුකොට සිංහල භාෂාව ද හොඳින් හදාරා සියලු රහස් තොරතුරු, උපාය මාර්ග, නායකයන්ගේ අභිප්‍රායන්, ඔවුන්ගේ දුර්වලතා යනාදිය අවබෝධ කොට ගත්තේ ය. උඩරට රජුට විරුද්ධ වූ හා රජුට පක්ෂ වූ රදළ ප්‍රධානීන් පිළිබඳවත්, රදළ

පවුල් අතර පැවති විරුද්ධතා යනාදිය පිළිබඳවත් මුහුදුබඩ ප්‍රදේශවල සිට මහනුවර දක්වා වැටී තිබූ සියලු මාර්ග, රජුගේ සේනා බලය, යුද්ධායුධ පිළිබඳවත් සියලු තොරතුරු ඔහු අධ්‍යයනය කෙළේ ය. රජුගේ වස්තුව සඟවනු ලබන ස්ථාන ද යුද්ධ කාලවල දී රජු සැඟවෙන තැන් ද සොයා දැනගත් ඔහු ආණ්ඩුකාරයාගේ උපදෙස් පරිදි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දුර්වල කිරීමේ යෝග්‍යතම උපාය මාර්ගය වශයෙන් හැම වර්ගයකට ම අයත් බ්‍රිතාන්‍ය මත්පැන් වර්ග නොයෙක් ක්‍රම මගින් රජුට යවා ඒවා භාවිතයට රජු ඇබ්බැහි කරවීමට ද සමත් විය. එපරිද්දෙන් වැඩිකල් යාමට පෙර උපක්‍රමශීලී ව උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමට අවශ්‍ය පසුබිම ක්‍රි.ව. 1814 පමණ වන විට සම්පාදනය වෙමින් තිබිණි.



රූපය 1.3
රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා

## ක්‍රි.ව. 1815 බ්‍රිතාන්‍යයන්ගේ උඩරට ආක්‍රමණය

ක්‍රි.ව. 1814 කාලය වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ජනතාව අතර අප්‍රසාදයට පත් ව සිටියේ ය. නායක්කර් වංශයේ රදළයන්ට විශේෂ වරප්‍රසාද දීම, සිංහල රදළ ප්‍රධානීන්ගේ වරප්‍රසාද අහිමි කිරීම, උඩරට රාජ්‍යයේ සම්ප්‍රදායන්ට අයත් නොවූ ද ඉතා අමානුෂික වූ ද දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීම, රාජකාරි ක්‍රමය යටතේ මිනිසුන්ගෙන් අසාධාරණ ලෙස වැඩ ගැනීම වැනි භික්ෂූන් වහන්සේලා ද, රදළයන් ද, මහජනයා ද කුපිත කරවන කටයුතු රාශියක රජු නිරත විය.

රජු හා රදළ ප්‍රධානීන් අතර විරුද්ධතා ගොඩ නැඟෙද් දී උඩරට රාජ්‍යය ව්‍යාකූල තත්ත්වයකට පත් විය. රජුට විරුද්ධව නිතර කැරළි කෝලාහල ඇති විය. ප්‍රතිවිරුද්ධ රදළ යන් අතර පැවති විරුද්ධත්වයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා ඔවුන්ගේ පාලන ප්‍රදේශ වරින් වර මාරු කිරීමේ ප්‍රතිපත්තියක් ද රජු විසින් ක්‍රියාත්මක කරන ලදී. තමන්ට විරුද්ධ වූ රදල ප්‍රධානීන්ට දැඩි දඬුවම් දීමටත් ඔවුන්ට ආධාර උපකාර කළ ප්‍රදේශවල ජනතාවට වධ හිංසා කිරීමටත් පටන් ගත්තේ ය. මෙම පසුබිම යටතේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනට පත් කළ අය ම ඔහුට විරුද්ධ බල වේගය ලෙස නැඟී සිටියහ. පිළිමතලව්වේ මහ අදිකාරම ඔහුගේ ප්‍රධානතම සතුරා බවට පත් වී සිටියේ ය. ක්‍රි.ව. 1811 දී ඔහු විසින් රජු ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කරන ලදී. එය හෙළි වීමෙන් පිළිමතලව්වේ මරණීය දණ්ඩනයට ලක් විය.

පිළිමතලව්වේගෙන් පසුව මහාදිකාරම් ධූරයට පත් ඇහැලේපොල ද රජුට විරුද්ධව සබරගමුවේ කැරැල්ලක් ඇති කෙළේ ය. එයට ප්‍රතිචාර වශයෙන් රජු කැරලි මැඩලීමට සබරගමුවට සේනාවක් යැවූ නමුත් ඇහැලේපොල අත්අඩංගුවට ගැනීමට නොහැකි විය. ඒ නිසා මහනුවර සිටි ඔහුගේ බිරිඳ හා දරුවන් ඉතා අමානුෂික ලෙස මරා දැමූ බව සඳහන් වේ. එහෙත් රජු නියමිත දඬුවම් පැමිණ වූවා මිස එබඳු කෲර ක්‍රියාවක් නොකළ බවට ද මතයක් ඇත. කෙසේ වුව ද එම සිද්ධිය හේතු කොට ඇහැලේපොල මහාදිකාරමට ඉංග්‍රීසීන්ගේ රැකවරණය සොයා යාමට සිදු විය.

උඩරට රජුට විරුද්ධව සටනක් මෙහෙයවීමට අවස්ථාව එන තුරු ඇඟිලි ගනිමින් සිටි බ්‍රවුන්රිග්ට මෙය කදිම අවස්ථාවක් විය. උඩරට ආක්‍රමණය කිරීමට තුඩුදුන් ආසන්න හේතුව වූයේ එම ප්‍රදේශවලට ගිය වෙළෙඳුන් පිරිසකගේ අත් කන්, නාසා කපා ඔවුන් එළවා දැමීම යි. ඔවුන්ගෙන් කිහිප දෙනකු උඩරට ප්‍රදේශවලදී ම මිය ගිය අතර සෙසු අය තමන්ට මුහුණ දීමට සිදු වූ තත්ත්වය පිළිබඳව ආණ්ඩුකාරයාට පැමිණිලි කළහ.

මෙම සිද්ධිය මගින් උඩරට රජු ඉංග්‍රීසීන්ට අපහාසයක් සිදු කළ බව කියා සිටි අතර උඩරට වැසියා කෲර රජුගෙන් ගලවා ගැනීම හේතුව සේ දක්වමින් බ්‍රවුන්රිග් උඩරට රජුට විරුද්ධ ආක්‍රමණයක් දියත් කෙළේ ය. උඩරටියන්ගේ සතුරා ඉංග්‍රීසීන් නොව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බව ඒත්තු ගැන්වීමට ඉංග්‍රීසීහු කටයුතු කළහ. ඉංග්‍රීසි හමුදාව උඩරටට ගිය ගමන ආක්‍රමණය කිරීමක් නොව උඩරටියන්ගේ ආරාධනය පිළිගැනීමක් වශයෙන් සිදු කෙරුණක් බව මවා පෑමට ඉංග්‍රීසීහු සමත් වූහ.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධ බලවේගයක් ඇතිවීමට තුඩු දුන් හේතු පෙළගස්වන්න.

මීළඟට බ්‍රිතාන්‍යයන් ගේ දෙවන උඩරට ආක්‍රමණ සාර්ථක වීමට හේතු වූ සාධක කෙරේ අවධානය යොමු කරමු.

නෝර්ත් ආණ්ඩුකාරයා ක්‍රි.ව. 1803 දී උඩරට ආක්‍රමණය කරන විට පැවති ස්වාභාවික ආරක්ෂාව මෙකල ද එසේ ම තිබිණි. එහෙත් උඩරටට සේන්දු වීමේ දී නෝර්ත්ට මෙන් බ්‍රවුන්රිග්ට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූයේ නැත. එයට හේතු වූයේ ක්‍රි.ව. 1803 දී හෝ ඉන් පෙර යුරෝපීයයන් උඩරටට එන විට හෝ උඩරටියන්ගෙන් එල්ල වූ විරෝධය මෙවර දක්නට නොලැබීම යි. ඇහැලේපොලගේ මඟ පෙන්වීම ඉංග්‍රීසින්ට උඩරටට යෑමට මහත් රුකුලක් විය. ඔහු ඉංග්‍රීසීන් වෙත පලා යාමෙන් පසු උඩරට මහාදිකාරම් තනතුරට පත් කොට සිටි මොල්ලිගොඩ ද මේ අවස්ථාවේ දී විරුද්ධත්වයක් නොදක්වා පසු බැස්සේ ය.

උඩරට රාජ්‍යයට විදේශීය ආක්‍රමණයක් එල්ල වූ හැම අවස්ථාවක ම පාහේ රජවරුන් ක්‍රියා කළ ආකාරයට 1815 ආක්‍රමණය සිදු වූ අවස්ථාවේ ද රජු මහනුවර අත්හැර පලා ගොස් සුපුරුදු ආරක්ෂක ස්ථානයක සැඟවී සිටියේ ය. එහෙත් ඊට පෙර කිසි කලක සිදු නොවූ පරිදි ක්‍රි.ව. 1815 පෙබරවාරි 18 වැනිදා ඉංග්‍රීසින් සමඟ සිටි සිංහල වැසියෝ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ද , ඔහුගේ බිසෝවරුන් ද ඉංග්‍රීසීන්ට අල්වා දුන්හ. මේ අවස්ථාවේ දී එහි සිටි පිරිස විසින් බිසව පැළඳ සිටි කුණ්ඩලාභරණ පවා කඩා ගත් බව කියැ වේ. එවිට ගැලූ ලේ තැවරුණු හැට්ටය තවමත් කොළඹ කෞතුකාගාරයේ දී දැක ගත හැකි ය.

උඩරට රාජ්‍යය යටත් කිරීම සඳහා ඉංග්‍රීසීන් විසින් ගන්නා ලද ප්‍රයත්නය ක්‍රි.ව. 1815 දී මෙසේ සාර්ථක විය.

ක්‍රි.ව. 1815 ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍යය ජය ගැනීමට උපකාරී වූ ප්‍රධානතම සාධකය වූයේ එතෙක් රජු, රදළ ප්‍රදනීන් සහ ජනතාව අතර තිබූ සහයෝගී සබඳතාව බිඳී ගොස් ජනතාවගේ රාජ පාක්ෂික භාවය හීනවී පැවතීමයි.



රූපය 1.4
ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසව : ''රංගම්මා''

යුද්ධය අවසානයේ දී බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා සහ උඩරට ප්‍රධානීන් ක්‍රි.ව. 1815 මාර්තු මස දෙවන දින මහනුවර රාජසභා මණ්ඩපයේ දී එනම් මඟුල් මඩුවේ දී ගිවිසුමකට එළඹීම සඳහා වූ කොන්දේසි ඉදිරිපත් කෙරිණි. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ඇතුළු ප්‍රධානීන් කීපදෙනෙකු විසින් එය අත්සන් කරණු ලැබුවේ මාර්තු 10 වැනි දින ය. ඇහැලේපොල අදිකාරම ඇතුළු තවත් රදළ ප්‍රධානීන් කිහිපදෙනෙකු ගිවිසුම අත්සන් කෙළේ ඊටත් පසු අවස්ථාවලදී ය.

මාර්තු 2 වැනි දින ගිවිසුමේ වගන්ති ඉදිරිපත් කළ නමුත් කිසිවෙකු විසින් හෝ එය අත්සන් කිරීමට පෙර එවිට ගුවනේ ලෙලදෙමින් තිබූ සිංහ කොඩිය පහත හෙළා ඉංග්‍රීසීන්ගේ කොඩිය ඉහළ නංවනු ලැබී ය. ඉංග්‍රීසීන් ඔවුන්ගේ බලය පෙන්වීමට මෙන් සිදු කළ එම ක්‍රියාවෙන් කෝපයට පත් වූ වාරියපොල ශ්‍රී සුමංගල හිමියන් ක්ෂණයකින් ඉංග්‍රීසීන්ගේ කොඩිය බිම දමා පාගා සිංහ කොඩිය යළි එසවූ බව කියනු ලැබේ. එයින් පැහැදිලි වන්නේ ඉංග්‍රීසීන් විසින් උඩරට රාජ්‍යය අත්පත් කොට ගැනීමට එරෙහි වූ පිරිස් ඉංග්‍රීසීන්ට විරුද්ධව නිදහස් සටන ක්‍රි.ව. 1815 මාර්තු 2 වැනි දින ආරම්භ කළ බවයි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

**ක්‍රි.ව. 1815 උඩරට ආක්‍රමණය සාර්ථක වීමටත් 1803 ආක්‍රමණය අසාර්ථක වීමටත් හේතු පෙළ ගස්වන්න.**

ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුම ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කෙරේ. එනම් වසර 2000 කටත් වඩා දීර්ඝ කාලයක් ස්වෛරී, ස්වාධීන රාජ්‍යයක් ලෙස පැවති ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් විදේශීය ආධිපත්‍යයට යටත් වීම එම ගිවිසුම යටතේ සිදු වීම යි.